# පොලිස් මාධ්‍ය කොට්ඨාසය
## பொலிஸ் ஊடகப் பிரிவு
## POLICE MEDIA DIVISION
සුහුරුපාය, බත්තරමුල්ල

| | | | | | |
|---|---|---|---|---|---|
| තැ.පෙ.අංකය<br>த. பெ.இ<br>Po.Box No | 10120 | | | ෆැක්ස්<br>தொலைநகல<br>Fax | 011-2171635 |
| දුරකථන<br>தொலைபேசி<br>Telephone | 011-2887973<br>(HUNTING) | වෙබ්.ලිපිනය<br>இணையதளம்<br>Web Site | www.Police.lk | ඊ මේල්<br>மின்னஞ்சல்<br>E-mail | dir.media@police.gov.lk |


| | | | | | |
|---|---|---|---|---|---|
| මගේ අංකය<br>எனது இலக்கம்<br>My NO | 1833 / 2024 | ඔබේ අංකය<br>உமது இலக்கம்<br>Your No | / 2024 | දිනය<br>திக<br>Date | 11/12/2024<br>පැය 1840 |

## මාධ්‍ය නිවේදනය

**ප්‍රධාන කර්තෘ / ප්‍රවෘත්ති කර්තෘ,**
**අධ්‍යක්ෂ ප්‍රවෘත්ති / ප්‍රවෘත්ති කළමණාකරු,**
**සියළුම මාධ්‍ය ආයතන.**

**හෙරොයින් හා අයිස් මත්ද්‍රව්‍ය සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - පොලිස් විශේෂ කාර්ය බලකා සංවිධානාත්මක අපරාධ මර්ධන ඒකකය.**

2024.12.11 වන අද දින දහවල් කාලයේ කහතුඩුව පොලිස් වසමේ පොල්ගස්ඕවිට ප්‍රදේශයේදී පොලිස් විශේෂ කාර්ය බලකා සංවිධානාත්මක අපරාධ මර්ධන ඒකකයේ නිලධාරීන් කණ්ඩායමක් විසින් ලද තොරතුරක් මත වැටලීමක් සිදුකර කුළී පදනම මත ලබාගත් නිවසක සඟවා තිබූ **හෙරොයින් කිලෝග්‍රෑම් 05 කට ආසන්න ප්‍රමාණයක්, අයිස් මත්ද්‍රව්‍ය කිලෝග්‍රෑම් 01 ග්‍රෑම් 500 ක් හා ඩාන්සින් පිල් නැමැති මත්පෙති 800 ක පමණ ප්‍රමාණයක් (රුපියල් කෝටි 13 කට ආසන්න වටිනාකමකි) සමඟ සැකකරුවෙකු** අත්අඩංගුවට ගෙන ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 27 ක් වන නෑබඩ ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

මෙම මත්ද්‍රව්‍ය තොගය විදේශගතව සිටින මත්ද්‍රව්‍ය ජාවාරම්කාරියකට අයත් බවත්, ඇය විසින් මෙම මත්ද්‍රව්‍ය තොගය තිබූ නිවස කුළී පදනම මත ලබාගෙන මත්ද්‍රව්‍ය බෙදා හැරීම කර ඇති බවටත්, සිදුකරන ලද විමර්ශනයේදී අනාවරණය වී ඇත. පොලිස් විශේෂ කාර්ය බලකා සංවිධානාත්මක අපරාධ මර්ධන ඒකකය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

**පොලිස් මාධ්‍ය කොට්ඨාසය.**